මාධ්‍ය නිවේදනය
සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

නිකුත් කළේ	ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව
දිනය	2022 අප්‍රේල් මස 29 වන දින

ශ්‍රී ලංකා මහ බැංකුව 2021 වසර සඳහා වන සිය වාර්ෂික වාර්තාව නිකුත් කරයි

1949 අංක 58 දරන මුදල් නීති පනතේ 35වන වගන්තියට අනුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ 72වැනි වාර්ෂික වාර්තාව මහ බැංකු අධිපති, ආචාර්ය පී. නන්දලාල් වීරසිංහ මහතා විසින් ගරු මුදල් අමාත්‍ය, එම්. යූ. එම්. අලි සබ්රි මැතිතුමා වෙත අද දින (2022 අප්‍රේල් මස 29) පිළිගන්වන ලදී.

[ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති ආචාර්ය පී. නන්දලාල් වීරසිංහ මහතා විසින් 2021 වසර සඳහා වූ වාර්ෂික වාර්තාව ගරු මුදල් අමාත්‍ය, එම්. යූ. එම්. අලි සබ්රි මැතිතුමා වෙත පිළිගැන්වීම. භාණ්ඩාගාර ලේකම් කේ. එම්. එම්. සිරිවර්ධන මහතා, ශ්‍රී ලංකා මහ බැංකුවේ සහකාර අධිපති ඒ. ආර්. කේ. විජේසේකර මහතා, ආර්ථික පර්යේෂණ අධ්‍යක්ෂ ආචාර්ය පී. කේ. ජී. හරිස්චන්ද්‍ර මහතා, ආර්ථික පර්යේෂණ අතිරේක අධ්‍යක්ෂවරුන් වන ආචාර්ය එස්. ජෙගජීවන් මහත්මිය සහ ආචාර්ය ඊ. ඩබ්ලිව්. කේ. ජේ. බී. ඇහැලේපොල මහතා ද මෙම අවස්ථාවට සහභාගී වූහ.]

ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාවෙන් පිළිබිඹු වන පරිදි 2021 වසරේ ශ්‍රී ලංකා ආර්ථිකය පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

ශ්‍රී ලංකා ආර්ථිකය 2020 වසරේ දී වසංගතයේ බලපෑම හේතුවෙන් සංකෝචනය වීමෙන් අනතුරුව 2021 වසරේ දී යථා තත්ත්වයට පත් වුවද, දශක කිහිපයක් මුළුල්ලේ ගැඹුරින් මුල් බැසගත් ව්‍යුහාත්මක ගැටලු සහ දුර්වලතා කිහිපයක් නැවත ඉස්මතු වීමෙහි ප්‍රතිඵලයක් ලෙස 2022 වසරේ මුල් කාලයේ දී පෙර නොවූ ආකාරයේ සමාජ-දේශපාලන අර්බුදයන්ට මුහුණ දුන්නේය. කොවිඩ්-19 වසංගතය සහ ගෝලීය හා දේශීය වශයෙන් ඇති වූ අනෙකුත් විවිධ ආකාරයේ බාධා මගින් ආර්ථිකයට බලපෑම් ඇති වන අවස්ථාව වන විටත්, කම්පනවලට ඔරොත්තු දීමට අවශ්‍ය ස්වාරක්ෂක නොමැතිකම හේතුවෙන්, ශ්‍රී ලංකා ආර්ථිකය දුර්වල තත්ත්වයක පැවතුණි. 2019 වසර අවසානයේ දී බදු ව්‍යුහයෙහි සිදු කළ වෙනස්කම් හේතුවෙන් තවදුරටත් සීමා වූ රාජ්‍ය මූල්‍ය අවකාශය, ආර්ථිකයේ එවැනි දුර්වලතාවලට ප්‍රධාන වශයෙන් හේතු විය. ලෝකයේ අනෙකුත් රටවල් මෙන්ම ශ්‍රී ලංකාව ද, ආර්ථිකයේ දිගුකල් පවතින පසුබෑම සහ ජීවනෝපායන් කෙරෙහි ඇතිවන බලපෑම් වළක්වාලමින් ආර්ථිකය සුරක්ෂිත කිරීමේ අරමුණු ඇතිව වසංගතයට මුහුණදීම සඳහා ක්‍රියාමාර්ග ක්‍රියාවට නැංවීය. කෙසේ වෙතත්, රාජ්‍ය මූල්‍ය අංශයේ ප්‍රමාණවත් ප්‍රතිපත්තිමය අවකාශයක් නොමැතිකම හෝ රාජ්‍ය මූල්‍ය අංශය තුළින් ප්‍රමාණවත් ඉක්මන් මැදිහත්වීම් සිදු නොවීම හේතුවෙන්, ආර්ථිකයේ පවතින විශේෂිත දුර්වලතා සැලකිල්ලට ගනිමින්, සුවිශේෂී මුදල් ප්‍රතිපත්ති ලිහිල් කිරීම්, වෙළඳපොළට සහ රජයට ප්‍රමාණවත් ද්‍රවශීලතා සැපයීම් සහ විදේශ හා මූල්‍ය අංශයේ ප්‍රතිපත්ති හරහා ආර්ථිකය ආරක්ෂා කර ගැනීමට දැඩි ලෙස මැදිහත් වීමට ශ්‍රී ලංකා මහ බැංකුවට සිදු විය. මහ බැංකුව සහ රජය විසින් ක්‍රියාත්මක කරන ලද අතිශය ලිහිල් සාර්ව ආර්ථික ප්‍රතිපත්ති පැකේජය, 2020 වසරේ දී ඉතිහාසගත ලෙස සංකෝචනය වූ ආර්ථිකය, 2021 වසරේ දී යථා තත්ත්වයට පත් වීම සඳහා සහාය සැලසූ අතර, ආර්ථික පාර්ශ්වකරුවන්ගේ විශාල කොටසකට වසංගතය මගින් වූ බලපෑම අවම කිරීමට ද සහාය සැලසුණි. රාජ්‍ය සහ පෞද්ගලික යන දෙඅංශයටම කාරක ප්‍රාග්ධන සහ ආයෝජන සඳහා අඩු පිරිවැයක් යටතේ අරමුදල් පහසුකම් සැලසුණු අතර, එමගින් මෙම දුෂ්කර කාලය තුළ අඛණ්ඩ රඳා පැවැත්ම තහවුරු කිරීමටත්, යම් වර්ධනයක් ද සමඟින් කර්මාන්ත ක්‍රියාකාරීව පවත්වා ගැනීමටත් උපකාරී වීම හරහා රාජ්‍ය සේවා, උපයෝගිතා සේවා සහ භාණ්ඩ

ද.දේ.නි.යෙහි වර්ධනය සඳහා ආංශික දායකත්වය



මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

හා සේවා මහජනතාවට මෙන්ම අනෙකුත් අත්‍යවශ්‍ය සැපයුම් දාමයන් සඳහා අඛණ්ඩව සැපයීම සහතික කළේය. කෙසේ වෙතත්, වසංගතයේ උච්චතම අවස්ථාවේ දී ගනු ලැබූ පෙර නොවූ ආකාරයේ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග සමඟ, අපේක්ෂිත රාජ්‍ය මූල්‍ය සහාය ප්‍රමාණවත් ලෙස නොලැබීම හේතුවෙන්, ප්‍රතිපත්ති උත්තේජන ක්‍රියාමාර්ගවලින් බැහැර වීමට පැවති අවකාශ සීමා වීමත් සමඟ 2021 වසරේ දී සාර්ව ආර්ථික ස්ථායීතාව කෙරෙහි අනපේක්ෂිත බලපෑම් ඇති වූ අතර, එම බලපෑම් 2022 වසරේ මුල් කාලයේ දී තවදුරටත් උග්‍ර විය. තවද, දේශීය විදේශ විනිමය වෙළඳපොළේ අඩු ද්‍රවශීලතාව මධ්‍යයේ විනිමය අනුපාතිකය මත ඇති වූ පීඩන 2021 වසරේ දී සහ 2022 මුල් කාලයේ දී තීව්‍ර වීම හමුවේ, විනිමය අනුපාතිකයෙහි සිදු වන විශාල අවප්‍රමාණය වීමක් මගින් සමාජයට අහිතකර ලෙස බලපෑම් ඇති විය හැකි බවට අවධානය යොමු වී තිබුණු පසුබිමක වුවද, වෙළඳපොළ පැවති මට්ටමට සාපේක්ෂව විනිමය අනුපාතිකයේ නිසි ගැළපීමක අවශ්‍යතාවක් ඇති වූ බැවින් 2022 මාර්තු මස මුල් කාලයේ දී එය ක්‍රමානුකූලව සිදු වීමට ඉඩ හැරිණි. කෙසේ වෙතත්, ඉන්පසුව, 2022 මාර්තු මස මුල් කාලයේදීම විනිමය අනුපාතිකය නම්‍යශීලීවීමට ඉඩ ලබා දීමෙන් පසුව විනිමය අනුපාතිකය නිසි මට්ටම ඉක්මවා විශාල ලෙස අවප්‍රමාණය වීම හේතුවෙන් අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීමට යම් බාධාවක් ඇති වූ අතර එමගින් දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ පැවති සැලකිය යුතු ද්‍රවශීලතා පීඩන මෙන්ම වෙළඳපොළ නිවැරදි කිරීමේ ප්‍රමාදය පිළිබිඹු විය.

විනිමය අනුපාතිකය හා දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ මහ බැංකුවේ මැදිහත්වීම



පසුගිය දශකයකට වැඩි කාලයක් තුළ සාර්ව ආර්ථික ස්ථායීතාව සඳහා ශක්තිමත්ම සාධකය වූ මිල ස්ථායීතාව 2021 වසරේ දෙවන භාගයේ සිට අභියෝගයට ලක්ව ඇති අතර, ඒ සඳහා ගෝලීය හා දේශීය සැපයුම් මත පදනම් වූ හේතු මෙන්ම සීමිත රාජ්‍ය මූල්‍ය අවකාශය මධ්‍යයේ පෙර නොවූ පරිදි මහ බැංකුවෙන් ලබා දුන් මූල්‍ය සහාය ඇතුළු සුවිශේෂී මුදල් ලිහිල්කරණයේ පසු බලපෑම මූලික වශයෙන් හේතු කොටගෙන මිල මත අධික ඉල්ලුම් පීඩන ඇති වීමෙහි ඒකාබද්ධ බලපෑම හේතු විය. තවද, දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි විශාල වශයෙන් ද්‍රවශීලතාව හිඟයක් පවතින වාතාවරණයක් තුළ,

මතුපිට උද්ධමනය (වාර්ෂික ලක්ෂ්‍යමය)



අත්‍යවශ්‍ය ආනයන මූල්‍යනය කිරීමේ දැඩි අවශ්‍යතාව මෙන්ම සැලකිය යුතු ණය සේවාකරණ වගකීම් හමුවේ ප්‍රමාණවත් නොවන මට්ටමක පැවති නිල සංචිත මගින් පිළිබිඹු වූ ඉහළ යන ගෙවුම් ශේෂ පීඩන හේතුවෙන් 2021 වසර අවසානයේ සිට විදේශීය අංශය දැඩි අවදානම් තත්ත්වයක් ආසන්නයේ පැවතිණි. විදුලිබල හා බලශක්ති ක්ෂේත්‍රයේ පවතින ගැටලුකාරී තත්ත්වය සහ අත්‍යවශ්‍ය භාණ්ඩ හා අමුද්‍රව්‍යවල උග්‍ර හිඟය මෙන්ම ආර්ථිකයේ සෑම අංශයකටම මෙමගින් ඇති විය හැකි බලපෑම් යනාදිය කඩිනමින් නොවිසඳන්නේ නම් එමගින් ආර්ථික කටයුතුවලට විශාල ලෙස බාධා ඇති විය හැකිය. මෙම අහිතකර තත්ත්වයන් නිරාකරණය කිරීමට හෝ කල් දැමීමට වරින් වර ගන්නා ලද අසම්පූර්ණ ක්‍රියාමාර්ග සහ ප්‍රතිපත්ති පියවර අසාර්ථක වී ඇති බව හෝ එමගින් නව ගැටලු නිර්මාණය කර ඇති බව පෙනී යයි. ඉතිහාසයේ මෙතෙක් පැවති ඉහළම රාජ්‍ය ණය මට්ටම, රාජ්‍ය මූල්‍ය ශේෂයන් තවදුරටත් දුර්වල වීම සහ අතිශයින් පහළ ස්වෛරීත්ව ශ්‍රේණිගත කිරීම් හේතුවෙන්, ආර්ථිකය නැවත සාමාන්‍ය තත්ත්වයට ගෙන ඒම පිණිස ඉහත දැක් වූ දේශීය ආර්ථික තත්ත්වයන් ලිහිල් කිරීම සඳහා සැලකිය යුතු මැදිහත්වීමක් සිදු කිරීමට රාජ්‍ය මූල්‍ය අංශයට ඇති හැකියාව ඉතා සීමිතය. එහි ප්‍රතිඵලයක් ලෙස, සාර්ව ආර්ථික ස්ථායීතාවය තවදුරටත් පිරිහීම වැළැක්වීමට සහ මිල ස්ථායීතාව නැවත ඇති කිරීමට මුදල් ප්‍රතිපත්තිය ඉතා දැඩි කිරීම ආදී ක්‍රියාමාර්ග තුළින් මහ බැංකුව 2022 අප්‍රේල් මස මුල් කාලයේ දී කඩිනම් ක්‍රියාමාර්ග ගත්තේය. මෙම ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග මගින් දිගු කාලීන වශයෙන් ආර්ථිකයේ සෑම අංශයකටම ප්‍රතිලාභ ලැබෙන පරිදි වූ වර්ධනයක් සඳහා අවශ්‍ය සාධකයක්ව පවතින සැලකිය යුතු ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ සිදු කිරීම ආරම්භ කිරීම මගින් මැදි කාලයේ සිට දිගු කාලීනව සාර්ව ආර්ථික ස්ථායීතාව යළි ඇති කරනු ඇත.

නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝව සහ තෝරාගත් වෙළඳපොළ පොලී අනුපාතික



(අ) 2022 අප්‍රේල් 8 වැනි දිනට

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

මේ සම්බන්ධයෙන්, ශ්‍රී ලංකා මහ බැංකුව ක්‍රියාවට නැංවූ ප්‍රතිපත්තිවලට අනුරූපීව රජය විසින් ද ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ගණනාවක් මේ මොහොතේ ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය වේ. දිගු කාලයක් තිස්සේ ප්‍රමාද වූ සහ අතීතයේ බොහෝ විට නැවත හැරවූ ශක්තිමත් රාජ්‍ය මූල්‍ය ප්‍රතිසංස්කරණ ක්‍රියාවට නැංවීම මගින්, වර්තමානයේ පවතින සංකීර්ණ ගැටලුකාරී ආර්ථික තත්ත්වයන්හි පැහැදිලි වෙනසක් ඇති කරනු ඇත. රජයේ ආදායම ඉහළ මට්ටමක් කරා වර්ධනය කිරීම සහ රජයේ වියදම් සීමා කිරීම හා ප්‍රමුඛතා හඳුන්වාදීම මගින් අයවැය හිඟය තිරසාර ලෙස අඩු කිරීම, ඉදිරි කාලයේ දී රජයේ ණය ගැනීම් ප්‍රසාරණය වීම අවම කර ගැනීමට උපකාරී වනු

ඇත. තවද, වත්මන් ආර්ථික ගැටලුව විසඳීමට ගනු ලබන ඕනෑම ඉදිරි පියවරක් සඳහා රාජ්‍ය ණය තිරසාරභාවය සාක්ෂාත් කර ගැනීම සහ පවත්වාගෙන යෑම සඳහා වන පුළුල් සහ පැහැදිලි ප්‍රවේශයක් අත්‍යවශ්‍ය වේ. මෙම අත්‍යවශ්‍ය රාජ්‍ය මූල්‍ය වෙනස්කම් සඳහා, අනෙකුත් ක්‍රියාමාර්ග ගන්නා අතරම, රාජ්‍ය යාන්ත්‍රණය තුළ යහපාලනය සහ වගවීමේ යාන්ත්‍රණ ආයතනගත කිරීම, සමස්ත රාජ්‍ය අංශයේ සැලකිය යුතු ලෙස ඵලදායිතා වැඩිදියුණු කිරීම සහ සේවා සැපයීම, මනාව ඉලක්ක කළ සමාජ ආරක්ෂණ ජාල ශක්තිමත් කිරීම සහ පිරිවැය පිළිබිඹුවන මිල ව්‍යුහයන් හඳුන්වා දීම මගින් ඇතිවන මූල්‍යමය වශයෙන් ස්වාධීන සහ ස්වායත්ත රජය සතු වාණිජ ව්‍යාපාරවල සහාය ලැබිය යුතුය. රාජ්‍ය ආයතනවල මහජන වගවීම සහතික කිරීම සඳහා නීතිමය රාමු ශක්තිමත් කිරීම අවශ්‍ය වන අතරම, අදාළ බලධාරීන් විසින් ප්‍රතිපත්ති සම්පාදනයේ දී සහ ක්‍රියාත්මක කිරීමේ දී පවතින නෛතික බලතල ක්‍රියාත්මක කිරීම මගින් රට තුළ කල්පවත්නා ආර්ථික සුබසාධනයක් සහතික කරනු ඇත. මෙම වෙනස්කම් මගින් පෞද්ගලික අංශයේ ඉහළ සහභාගීත්වය සහතික කෙරෙන අතර, රාජ්‍ය අංශය විසින් ආර්ථිකය තුළ පහසුකම් සපයන්නෙකුගේ භූමිකාව අඛණ්ඩව සිදු කෙරෙනු ඇත.

රාජ්‍ය මූල්‍ය කාර්යසාධනයෙහි සාරාංශය
(ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස)



මධ්‍යම රජයේ ණය
(ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස)



ශ්‍රී ලංකාව දිගු කාලයක් තිස්සේ අත්විඳිනු ලබන 'ද්විත්ව හිඟය' මගින් ගෙවුම් තුලනයේ ගැටලු සඳහා තිරසාර විසඳුම් සෙවීමේ වැදගත්කම අවධාරණය කරයි. විදේශීය ජංගම ගිණුමේ හිඟය සහ අයවැය හිඟය කළමනාකරණය කළ හැකි මට්ටමක් දක්වා අඩු කර ගැනීම ඉලක්ක කර ගනිමින් අදාළ පාර්ශ්වකරුවන්ගේ සහාය ඇතිව සකස් කෙරෙන, වෙනස්වන දේශපාලන

ගෙවුම් තුලනය



පාලන තන්ත්‍රයන්ගේ බලපෑමෙන් නිදහස් ජාතික ප්‍රතිපත්ති, මෙම ප්‍රයත්නයේදී අත්‍යවශ්‍ය වේ. තවද, ගෙවුම් තුලනයේ විදේශීය ණය මූල්‍යකරණය සඳහා වූ අවශ්‍යතාව අඩු කරන අතරම, විදේශ සංචිත ඉහළ නැංවීම සඳහා වෙනත් ණය නොවන විදේශ විනිමය ඉපැයීමේ මූලාශ්‍ර වෙත අවධානය යොමු කළ යුතු වේ. හිතකර ව්‍යාපාරික පරිසරයක් ගොඩනැංවීම සහ විදේශීය සෘජු ආයෝජන ප්‍රවර්ධනය කිරීම ද මෙම විදේශීය අංශය ස්ථායී කිරීමේ වැඩපිළිවෙළට ඇතුළත් විය යුතුය.

සාර්ව ආර්ථික ස්ථායීතාව, සමාජ සහජීවනය සහ දේශපාලන ස්ථාවරත්වය එකිනෙක හා සම්බන්ධ වී ඇති ආකාරය සහ එක් එක් අංශ මත අනෙක් අංශයෙන් සිදුවන බලපෑම මෑත කාලීනව ශ්‍රී ලංකාව විසින් මුහුණ දෙනු ලබන සිදුවීම්වලින් පෙන්නුම් කරයි. ඒ අනුව, ආර්ථික අස්ථාවරත්වය, සමාජ නොසන්සුන්තාවය සහ දේශපාලන අස්ථාවරත්වය යන දැනට පවත්නා ගැටලු ත්‍රිත්වය සඳහා වන සමස්ත විසඳුම ලෙස ශ්‍රී ලංකා ආර්ථිකය නැවත පණ ගන්වා නව මානයකට ගෙන ඒමට මෙම සියලු අංශ ආවරණය කළ යුතුය. ණය වගකීම් ක්‍රමානුකූලව සහ එකඟතාවයකින් යුතුව ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා රජය විසින් විදේශීය ණය සේවාකරණ ගෙවීම් යම් කාල සීමාවක් සඳහා අත්හිටුවීම, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ ආර්ථික ගැළපුම් වැඩසටහනක් කරා එළැඹීම, රජයේ වියදම් අඩු කිරීම හා රජයේ ආදායම ඉහළ නැංවීම සඳහා කැපවීම සහ නොබැඳි දේශපාලන හා ආර්ථික රාජ්‍යතාන්ත්‍රික කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යෑම ආදී ආර්ථික ගැටලු විසඳා ගැනීමට දරන අඛණ්ඩ උත්සාහය මගින් ඉදිරි කාලයේ දී සාර්ව ආර්ථික ස්ථායීතාව නැවත ළඟා කර ගැනීමට අපේක්ෂා කෙරේ. සමාජ සහජීවනය නැවත සහතික කිරීම සහ දේශපාලන ස්ථාවරත්වය නැවත ස්ථාපිත කිරීම මෙන්ම අඛණ්ඩ දේශපාලනික සහයෝගය මත මෙම ප්‍රයත්නවල සමස්ත සාර්ථකත්වය රඳා පවතින අතර, එය මෙම ප්‍රතිසංස්කරණ ඉදිරියට පවත්වාගෙන යෑම සඳහා අත්‍යවශ්‍ය වේ.

2021 වසරේ ජාතික නිෂ්පාදිතය, වියදම, ආදායම සහ සේවා නියුක්තිය සංක්ෂිප්තයක් ලෙස



ද.දේ.නි. පවත්නා වෙළඳපොළ මිල අනුව
රු. බිලියන 16,809
එ.ජ. ඩොලර් බිලියන 84.5

මධ්‍ය වාර්ෂික ජනගහනය (පුද්ගලයන් දහස්)
22,156

ඒක පුද්ගල ද.දේ.නි.
රු. 758,680
එ.ජ. ඩොලර් 3,815



නිෂ්පාදන ප්‍රවේශය



සේවා 3.0% ↑
මූල්‍ය කටයුතු ඉහළ යෑම ප්‍රධාන වශයෙන් හේතු විය.

කර්මාන්ත 5.3% ↑
නිෂ්පාදන කටයුතු ඉහළ යෑම ප්‍රධාන වශයෙන් හේතු විය.

කෘෂිකර්මාන්තය 2.0% ↑
තෙල් සහිත පලතුරු භෝග වගා කටයුතු ඉහළ යෑම ප්‍රධාන වශයෙන් හේතු විය.

බදු-සහනාධාර 4.9% ↑

වියදම් ප්‍රවේශය



පෞද්ගලික පරිභෝජනය 10.8% ↑
ආහාර සඳහා වූ වියදම ඉහළ යෑම ප්‍රධාන වශයෙන් දායක විය.

රාජ්‍ය පරිභෝජනය 3.7% ↑
ආරක්ෂාව සහ සමාජ ආරක්ෂණය සඳහා වූ වියදම ඉහළ යෑම ප්‍රධාන වශයෙන් දායක විය.

දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය 23.2% ↑
දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය ඉහළ යෑම ප්‍රධාන වශයෙන් දායක විය.

ශුද්ධ අපනයන -31.6% ↓
ආනයන වටිනාකම වැඩි වශයෙන් ඉහළ යෑම බලපාන ලදී.

- භාණ්ඩ හා සේවා අපනයන 23.3% ↑
- භාණ්ඩ හා සේවා ආනයන 25.7% ↑

ආදායම් ප්‍රවේශය



සේවක ආදායම් 8.5% ↑

දළ මෙහෙයුම් අතිරික්තය 13.6% ↑

- ශුද්ධ මෙහෙයුම් අතිරික්තය 14.0% ↑
- මිශ්‍ර ආදායම් 11.9% ↑
- ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය 12.4% ↑

නිෂ්පාදනය මත වෙනත් බදු-සහනාධාර 4.2% ↑

ශ්‍රම වෙළඳපොළ දර්ශක

ශ්‍රම බලකාය	ආර්ථික වශයෙන් සක්‍රීය නොවන ජනගහනය	ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය	සේවා නියුක්ත ජනගහනය	සේවා වියුක්ති අනුපාතිකය	විදේශ රැකියා සඳහා පිටත්ව යෑම්
↑	↑	↓	↑	↓	↑
මිලියන 8.467 (2020)	මිලියන 8.273 (2020)	50.6% (2020)	මිලියන 7.999 (2020)	5.5% (2020)	53,711 (2020)
මිලියන 8.553 (2021)	මිලියන 8.581 (2021)	49.9% (2021)	මිලියන 8.114 (2021)	5.1% (2021)	121,795 (2021)

ආර්ථික හා සමාජ යටිතල පහසුකම්වල ක්‍රියාකාරීත්වය





(අ) නිතර මිල උච්චාවචනය වන ආහාර කාණ්ඩයට සහල්, මස් වර්ග, නැවුම් මත්ස්‍ය සහ මුහුදු ආහාර, පොල්, පලතුරු, එළවළු, අර්තාපල්, ළූණු සහ තෝරාගත් කුළුබඩු වර්ග ඇතුළත් වේ.

(ආ) අනෙකුත් ආහාර කාණ්ඩයට නිතර මිල උච්චාවචනය වන ආහාර අයිතම හැර අනෙකුත් ආහාර ඇතුළත් වේ.

(ඇ) නාමික සහ මූර්ත වැටුප් වෙනස ලෙස 2021 සහ 2020 වසරවල සාමාන්‍ය අතර ප්‍රතිශතමය වෙනස දක්වා ඇත.

(ඈ) පඩිපාලක සභා මගින් වැටුප් පාලනය වන විධිමත් පෞද්ගලික අංශයේ සේවකයන්ගේ වැටුප් වේ.

විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය





ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ශේෂ
(ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස)
අයවැය ශේෂය
-12.2%
(-11.1%)
සමස්ත අයවැය ශේෂය
-7.7%
(-7.9%)
වර්තන ගිණුමේ ශේෂය
-6.0%
(-4.6%)
ප්‍රාථමික ශේෂය
මධ්‍යම රජයේ අයවැය
2021
(2020)
අයවැය හිඟය මූල්‍යනය
ආදායම් සහ ප්‍රදාන (ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස)
ආදායම් බදු 1.8% (1.8%)
නිෂ්පාදන/සුරා බදු 1.8% (2.1%)
එකතු කළ අගය මත බදු 1.8% (1.6%)
වරාය සහ ගුවන්තොටුපළ බදු 0.9% (0.8%)
ආනයන බදු 0.4% (0.8%)
වෙනත් බදු 1.0% (1.1%)
බදු නොවන ආදායම් 0.9% (1.0%)
Rs
රජය
වියදම් (ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස)
පොලී ගෙවීම් 6.2% (6.5%)
වැටුප් හා වේතන 5.0% (5.3%)
ප්‍රාග්ධන වියදම් සහ ශුද්ධ ණය දීම් 4.6% (3.3%)
සහනාධාර සහ පැවරුම් 4.1% (4.8%)
අනෙකුත් භාණ්ඩ හා සේවා 1.0% (1.2%)
අයවැය මූල්‍යනය
2021
අයවැය හිඟය (12.2% ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස)
ශුද්ධ විදේශ ණය ආපසු ගෙවීම් (0.1% ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස)
දේශීය මූල්‍යනය (12.3% ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස)
2020
අයවැය හිඟය (11.1% ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස)
ශුද්ධ විදේශ ණය ආපසු ගෙවීම් (0.6% ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස)
දේශීය මූල්‍යනය (11.7% ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස)
මධ්‍යම රජයේ නොපියවූ ණය
විදේශීය ණය
සහනදායී නොවන 50.6 52.3
සහනදායී 49.4 47.7
2020 2021
රු. බිලියන 17,589
රු. බිලියන 15,117
36.9%
63.1%
40.0%
60.0%
දේශීය ණය
බැංකු නොවන 47.8 50.7
බැංකු 52.2 49.3
2020 2021
2020 2021
විදේශීය ණය
2020 2021
දේශීය ණය
ප්‍රධාන පනත් - 2021
2021 අංක 9 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත
13 මැයි
2021 අංක 12 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම) (සංශෝධන) පනත
14 ජූනි
2021 අංක 18 දරන මුදල් පනත
15 සැප්.
13 මැයි
2021 අංක 10 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත
16 අගෝ.
2021 අංක 16 දරන සේවකයන්ගේ ජාතික අවම වේතන (සංශෝධන) පනත
12 නොවැ.
2021 අංක 26 දරන විසර්ජන (සංශෝධන) පනත
මධ්‍යම රජයේ ණය
(ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස)
84.2%
86.9%
100.6%
104.6%
DEBT
2018
2019
2020
2021



ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2021 අගෝස්තු දක්වා ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයක් පවත්වාගෙන ගියේය
ඉතිහාසයේ මෙතෙක් පැවති අවම පොලී අනුපාතික
ඉහළ ද්‍රවශීලතාව
පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය ඉහළ යෑම
Rs
30.2%
ආහාර උද්ධමනය
13.4%
ආහාර නොවන උද්ධමනය
මතුපිට උද්ධමනය 2022 මාර්තු
කො.පා.මි.ද. (වාර්ෂික ලක්ෂ්‍යමය)
18.7%
අභියෝග?
උද්ධමන පීඩන
INFLATION
විදේශීය අංශයේ සහ මූල්‍ය වෙළඳපොළ අසමතුලිතතා
අඩු ආර්ථික වර්ධනය
මහ බැංකුව විසින් ආර්ථිකය වෙත ලබා දුන් ඇතැම් සුවිශේෂී පහසුකම් අඩු කරන ලදී
ප්‍රධාන ප්‍රතිපත්ති පොලී අනුපාතික
පදනම් අංක 900
ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය
පදනම් අංක 200
ඇතැම් ණය උපකරණ මත පනවා තිබූ උපරිම පොලී අනුපාතික සීමා ඉවත් කරන ලදී
%
වෙළඳපොළ පොලී අනුපාතික ඒවායේ අවම මට්ටම්වල සිට ඉහළ ගියේය
එක් දින ද්‍රවශීලතාවය
2021 අවසානයට
රු. බිලියන -366.3
මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග මගින් උද්ධමන පීඩන මැදි කාලීනව අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරේ
රජය වෙත ලබා දුන් ශුද්ධ ණය
රජය සතු වාණිජ ව්‍යාපාර වෙත ලබා දුන් ණය
වාර්ෂික වෙනස (රු. බිලියන)
1,284
2021
186
1,752
2020
184
පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය
පුළුල් මුදල් (M2b)
2021 අවසානයට
13.1
වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය (%)
13.2
810
වාර්ෂික වෙනස (රු. බිලියන)
1,242
2020 අවසානයට
6.5
වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය (%)
23.4


26.8
2021 වසර අවසානයේ මූල්‍ය අංශයේ සමස්ත වත්කම් රුපියල් ට්‍රිලියන
බැංකු සංඛ්‍යාව
30
සමස්ත වත්කම් (%)
17.1
2020
15.4
2021
තැන්පතු (%)
21.6
2020
13.7
2021
වාර්ෂික වර්ධනය
බැංකු අංශයේ කාර්යසාධනය
බැංකු අංශය
63%
දළ අක්‍රීය ණය අනුපාතය (%)
2021 4.5
2020 4.9
ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතය- දේශීය බැංකු මෙහෙයුම් අංශය (%)
33.8
37.8
ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය (%)
16.5
16.5
සේවක අර්ථසාධක අරමුදල සහ වෙනත් විශ්‍රාම අරමුදල්
15%
අරමුදලේ සමස්ත වටිනාකම (%)
12.1
2021
11.2
2020
වාර්ෂික වර්ධනය
අරමුදලේ සාමාජිකයින් සඳහා වූ මුළු වගකීම් (රු.බිලියන)
2021 3,066.9
2020 2,767.8
118.2
2021
109.7
2020
ප්‍රතිගෙවුම් (රු.බිලියන)
සේවක අර්ථසාධක අරමුදලේ කාර්යසාධනය
165.7
2021
150.7
2020
වාර්ෂික දායකත්වය (රු.බිලියන)
2021
9.0%
2020
සාමාජික ගිණුම් සඳහා ගෙවූ පොලී අනුපාතිකය (%)
බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයේ කාර්යසාධනය
බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශය
6%
සමස්ත වත්කම් (%)
2021 6.1
2020 -2.2
වාර්ෂික වර්ධනය
ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය (%)
2021 17.0
2020 15.7
දළ අක්‍රීය ණය අනුපාතය (%)
2021 11.0
2020 13.9
වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය (%)
2021 5.4
2020 1.7
රක්ෂණ අංශය
3%
27
රක්ෂණ සමාගම් සංඛ්‍යාව
2021 12.2
2020 9.7
දළ ලියා හළ වාරිකය (%)
2021 11.4
2020 14.6
සමස්ත වත්කම් (%)
වාර්ෂික වර්ධනය
රක්ෂණ අංශයේ කාර්යසාධනය

සාර්ව ආර්ථික ක්‍රියාකාරිත්වය (2017-2021)

දර්ශකය	ඒකකය	2017	2018	2019	2020 (අ)	2021 (ආ)
මූර්ත අංශය (ඇ)						
මූර්ත ද.දේ.නි. වර්ධනය	සියයට	3.6	3.3	2.3 (අ)	-3.6 (ආ)	3.7
පවත්නා වෙළඳපොළ මිල අනුව ද.දේ.නි.	රුපියල් බිලියන	13,328	14,291	14,997 (අ)	15,027 (ආ)	16,809
ඒක පුද්ගල ද.දේ.නි. (ඈ)	එ.ජ. ඩොලර්	4,077	4,057	3,848 (අ)	3,695 (ආ)	3,815
විදේශීය අංශය						
වෙළඳ ශේෂය (ඇ)	ද.දේ.නි.යේ % වශයෙන්	-11.0	-11.8	-9.5	-7.4	-9.6
ජංගම ගිණුමේ ශේෂය (ඇ)	ද.දේ.නි.යේ % වශයෙන්	-2.6	-3.2	-2.2	-1.5	-4.0
සමස්ත ශේෂය	එ.ජ. ඩොලර් මිලියන	2,068	-1,103	377	-2,328	-3,967
විදේශීය නිල සංචිත	එ.ජ. ඩොලර් මිලියන	7,959	6,919	7,642	5,664	3,139
රාජ්‍ය මූල්‍ය අංශය (ඇ) (ඉ)						
වර්තන ගිණුමේ ශේෂය	ද.දේ.නි.යේ % වශයෙන්	-0.7	-1.2	-3.6 (ඊ)	-7.9	-7.7
ප්‍රාථමික ශේෂය	ද.දේ.නි.යේ % වශයෙන්	0.02	0.6	-3.6 (ඊ)	-4.6	-6.0
සමස්ත අයවැය ශේෂය	ද.දේ.නි.යේ % වශයෙන්	-5.5	-5.3	-9.6 (ඊ)	-11.1	-12.2
මධ්‍යම රජයේ ණය (උ)	ද.දේ.නි.යේ % වශයෙන්	77.9	84.2	86.9 (ඊ)	100.6	104.6
මුදල් අංශය සහ උද්ධමනය						
පුළුල් මුදල් වර්ධනය (M_{2b}) (ඌ)	සියයට	16.7	13.0	7.0	23.4	13.2
පෞද්ගලික අංශයට ලබාදුන් ණය වර්ධනය (M_{2b} හි) (ඌ)	සියයට	14.7	15.9	4.2	6.5	13.1
වාර්ෂික සාමාන්‍ය උද්ධමන අනුපාතිකය (එ)	සියයට	6.6	4.3	4.3	4.6	6.0

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2010 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.
(ඈ) නවතම ජනගහන සංඛ්‍යා දත්ත අනුව ඇස්තමේන්තු යාවත්කාලීන කර ඇත.
(ඉ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2022 මාර්තු 29 දින නිකුත් කරන ලද 2019 සහ 2020 සංශෝධිත ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.
(ඊ) මුදල් අමාත්‍යාංශයට අනුව, 2020 අයවැයෙහි ප්‍රකාශයට පත්කළ පරිදි, 2019 වසරට අදාළ රාජ්‍ය මූල්‍ය අංශයේ සංඛ්‍යාලේඛන සංශෝධනය කර ඇත.
(උ) 2013 මාර්තු මාසයේ දී ශ්‍රීලංකන් ගුවන් සමාගමට ප්‍රාග්ධනය සැපයීම සඳහා නිකුත් කරන ලද රුපියල් මිලියන 13,125ක් වටිනා භාණ්ඩාගාර බැඳුම්කර (2018 ජූනි 01 දින කල්පිරුණි) සහ 2012 ජනවාරි මාසයේ දී රජයේ ආයතන විසින් ශ්‍රී ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවට හිගව පැවති ණය පියවීම සඳහා නිකුත් කරන ලද රුපියල් මිලියන 78,441ක් වටිනා භාණ්ඩාගාර බැඳුම්කර (එයින් 2017 ජනවාරි 01 දින රුපියල් මිලියන 21,778ක් වටිනා බැඳුම්කර කල්පිරීම නිසා දැනට නොපියවූ ප්‍රමාණය රුපියල් මිලියන 56,662කි) ඇතුළත් වේ.
(ඌ) වසර අවසානයේ ලක්ෂ්‍යමය වර්ධනය
(එ) කො.පා.මි. දර්ශකය (2013=100) මත පදනම් වේ.

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
මුදල් අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව